# යෞවනියට ලැබෙන රැකවරණය

ලෝකයේ මෙන්ම අප රටේද ජනගහනයෙන් අඩක් වන කාන්තාව වෙනුවෙන්ද සංවර්ධන කටයුතු ආරම්භ කිරීමේ වැදගත් කම සැමවිටම අවධාරණය වුනා. එම බලාපොරොත්තුව මල් පල ගැන්වුනේ කාන්තා කටයුතු පිළිබඳව මෙරට ඉතිහාසයේ පළමුවරට අමාත්‍යාංශයක් බිහිවීමෙන්. එම ඉතිහාසගත ඇමති පදවියට පත්වූ ගරු සුනේත්‍රා රණසිංහ මැතිණිය සිය අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳව ''ගොවි ජනතාව'' නියෝජිත පිරියක් සමඟ කල සාකච්ඡාවකදී පල කළ අදහස් පහත පළවේ.

''විශේෂයෙන් තරුණ කාන්තාවන් පොදුවේ කාන්තා පරපුර පිළිබඳව සලකා ඔවුන්ගේ ජීවන තත්වය නගා ලීම දිවයිනෙහි සංවර්ධනයට කාන්තාවන්ගේ සහභාගිත්වය ලබා ගැනීමත් අරමුණු කරගෙන කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයක් ඇති කළා. අතීතයේ මෙන් නොව වර්තමානයේදී නගරබද මෙන්ම ගම්බද කාන්තාවද බොහෝ අවස්ථාවලදී රැකියාවක නියුතුව සිටී. එසේ නැතහොත් වෙනත් ආදායම් ලබන මාර්ගවල නියැලී කටයුතු කරයි. මෙවැනි කාන්තාවකගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට පමණක් නොව ඔවුන්ගේ සමාජ හා ආර්ථික ගැටළු පිළිබඳව සොයා බලා ඒ ගැන කටයුතු කිරීමට මේ අමාත්‍යාංශයෙන් බලාපොරොත්තු වෙනවා. නොයෙකුත් ආයතනවල සේවය කරන කාන්තාවන්ද ඔවුන්ගේ ආරක්ෂාව ආදිය පිළිබඳ විවිධ මාදිලියේ ප්‍රශ්න තිබෙනවා. ඒවගේම රැකියාවන් සඳහා පිටරට යන කාන්තාවන්ගේ ගැටළුවත් උග්‍ර බවට පත්වෙලා තිබෙනවා. එවැනි ප්‍රශ්න පිළිබඳව විවිධ අන්දමේ යෝජනා ක්‍රම මගින් අදාල කාන්තාවන්ට සහනයක් සලසා දීමට කාන්තා කටයුතු අමාත්‍යාංශයේ වගකීම් වලට ඇතුලත් වන කාර්යයක්.

කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා දියත් කළ ක්‍රියා මාර්ගයන් හි එක් වැදගත් අවස්ථාවක් වූයේ කාන්තා කාර්යංශය පිහිටුවීමයි. සෑම දිස්ත්‍රික්කයකින්ම දිසාපති කොට්ඨාශ 4 බැගින් තෝරාගෙන එක් කොට්ඨශයකින් කාන්තාවන් 500 යොදවා ඔවුන් ස්වයං රැකියා වල නිරත වීමට කාන්තා කාර්යාංශය දැන් වැඩ පිළිවෙලක් සකස් කර තිබෙනවා. මේ අනුව දැනට මත් 2000 ක් පමණ වන කාන්තා පිරිසක් සත්ත්ව පාලනය, කෘෂි කාර්මික කටයුතු, මීමැසි පාලනය,



සුනේත්‍රා රණසිංහ ඇමතිණිය: කාන්තාවන්ට රැකවරණ දෙන්නේ මෙලෙසයි.

මල් වැවීම, සිල්ලර කඩ කරගෙන යාම වැනි කටයුතුවල නිරතව සිටිනවා. මේ වැඩ පිළිවෙලේ මූලික පරමාර්ථය වූයේ තමන් ජීවත්වන ප්‍රදේශයේ ඇති සම්පත් උපයෝගී කරගෙන ඒ මගින් ආදායම් උපයා ගැනීමට හැකි අවස්ථාවන් විශේෂයෙන් ගැමි තරුණියන්ට ලබා දීමයි. මේ යෝජනා ක්‍රමය ලබන අවුරුද්ද වෙනකොට සෑම දිසාපති කොට්ඨාශයකම ව්‍යාප්ත කරන්න මම බලාපොරොත්තු වෙනවා. අනුරාධපුර වැනි දූර පළාත් වල සංචාරයේ යෙදුන මට පෙනී ගිය එක් කාරණයක් වූයේ මේ කටයුතු වල යෙදී සිටින තරුණියන් ඉතාමත් උද්‍යෝගයකින් හා උනන්දුවකින් ඒ කාර්යයන් වල නිරතව සිටින බවයි. ඒ අයගෙන් වැඩි දෙනෙක් මට කියා සිටියේ එවැනි ව්‍යාපාර වලින් ඒ තරුණියන් ලබන ලාභයෙන් දවසේ වියදම් පියවා තමන්ගේ අවශ්‍යතාවයන් සපුරා ගෙන ව්‍යාපාරයන් ඉදිරියට කරගෙන යාමට තරම් වියදම් ඔවුනට ලැබෙන බවයි. ඒ අයගෙන් වැඩි දෙනෙක් තෘප්තිමත් ජීවිතයක් ගත කරන බව මට පෙනී ගියා.

ඇතැම් අවස්ථාවලදී ඒ තරුණියන් නොයෙකුත් කරදර වලට මුහුණදී තිබෙනවා. ඒවගේම තමන්ගේ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම කඩාකප්පල්වී ගිය අවස්ථාද තිබෙනවා. තමන් ඇතිකරන සතුන් හැරී සාමෙන් ඇතැම් අවස්ථාවල ඔවුනට පාඩු වුනා. එහෙත් ඒ තරුණියන් ඒවායින් අධෛර්යයට පත් නොවී නැවතත් ඒ කටයුතු කර ගෙන යාමට තීරණය කරගෙන සිටින බව ඒ අය මා සමග පැවසුවා.

මේ වාගේ ව්‍යාපාර වල යෙදී සිටින ඇතැම් තරුණියන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් පවා සමත්වූ අයයි. ඒ අය මා සමග කියා සිටියේ පිට තැනකට රැකියාවකට යාමේදී ඇඳුම් පැළඳුම්, ගමන් ගාස්තු සඳහා වැය වන වියදම් ගැන සලකන විට



ගමේ සම්පත් උපයෝගිකර ගැනීමට එක්වූ තරුණියෝ

එවැනි රැකියාවකට වඩා මේ ස්වයං රැකියා ආදායම් මාර්ග හොඳ බවයි.

## ගැමිනාගරික තරුණියන්

"ගැමි කාන්තාව ගැන සලකන කල විශේෂයෙන් කුඹුරු වැඩ යනාදියේදී තම ස්වාමිපුරුෂයාත් සමග කුඹුරෙහි වැඩ කරමින් ඔවුන් හා සමාන කාර්ය භාරයක් කාන්තාව ඉටු කරයි. ඔවුන් කරන වැඩ කොටසකට සරිලන වැටුපක් හෝ අඩු තරමින් ඒ සේවය පිළිගැනීමක් වත්, කිසිම ක්‍රියා මාර්ගයක් වත් තවම දකින්න නැහැ. මෙවැනි අවස්ථාවලදී කාන්තාවට හිමිවිය යුතු අයිතිවාසිකම් ඉදිරි කාලය ඇතුළත ඔවුනට ලබා දීමට කාන්තා කටයුතු කාර්යාංශය අදහස් කරනවා."

"නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත්ව නොටයකුත් සංවිධාන වල සේවය කරන තරුණියන් විවිධ ආකාරයේ ප්‍රශ්න වලට මුහුණ දෙනවා. මේ සේවිකාවන් ඇතැම් අවස්ථාවලදී අනියම් පදනමක් මත සේවයට බඳවා ගෙන ඇති නිසා සාමාන්තරව සේවය කරන අනිකුත් සේවිකාවන් ලබන අයිතිවාසිකම් ඔවුනට ලැබෙන්නේ නැහැ. ඒ නිසා අදල අමාත්‍යාංශ සමග සාකච්ඡා කර ඒ අයටත් ප්‍රසූත නිවාඩු වැනි පහසුකම් ලබා දීමට කාන්තා කටයුතු අමාත්‍යාංශ බලාපොරොත්තු වෙනවා. මෙවැනි ප්‍රශ්න ඇති අවස්ථාවන්හිදී ඒවා කාන්තා කටයුතු අමාත්‍යාංශයට දන්වුවහොත් ප්‍රශ්නයට අදල වන හැටියට ඒ ඒ ආයතන සමග සාකච්ඡා කර එම ගැටළු වලට ඉක්මණින් විසඳුම් ලබා දීම මගේ යුතුකමක් ලෙස මම සලකනවා."

## සංස්කෘතිමය බැඳීම්

"අපේ රටේ ජනගහනයෙන් හරි අඩක් කාන්තාවන්. ඒ වගේම ඒ අය නොයෙකුත් විභාගවලදී පුරුෂ පක්ෂය මෙන්ම සාර්ථක ප්‍රතිඵල ලබා ගෙන තිබෙනවා. අපේ රටේ කාන්තාවන් හුඟාක්ම නැඹුරු වෙලා තිබුනේ ගුරු වෘත්තිය, හෙදි වෘත්තිය වගේ රක්ෂාවල් කන්නයි. ඒ උනත් අද කාන්තාව රජයේ උසස් තනතුරු දරනවාක් මෙන්ම පොලිසිය, සන්නද්ධ

සේවය වැනි මෙතෙක් කල් පුරුෂ පක්ෂයට සීමිතව තිබූ ස්ථානවලත් සේවයෙහි නියැලී සිටිනවා. කාන්තා කටයුතු ගැන සොයා බැලීමට කාන්තා කටයුතු අමාත්‍යාංශයක් පවා පිහිටුවා තිබෙන මේ අවස්ථාවක අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්. ඉදිරියේදී ශ්‍රී ලංකාවේත් කාන්තාවද පුරුෂයින් සමග සමතැන ගනිමින් කටයුතු කරන බව. කෙසේ වෙතත් අපි අමතක කළයුතු නැහැ. මෙරට කාන්තාව, සිංහල, බෞද්ධ සංස්කෘතික පරිසරයක හැදී වැඩී ස්ත්‍රීත්වය පිළිබඳ උතුම් ආකල්ප පදනම් කරගත් ජීවිතයක් ගත කරන කෙනෙක් බව. මොන ජයග්‍රහනයක් ලැබුවත් මෙරට කාන්තාවගේ යුතුකමක් වන්නේ අපේ රටේ සංස්කෘතික හා සදචාරාත්මක හරයන් ආරක්ෂා කිරීමයි.''

## සෞඛ්‍ය ආරක්ෂාව

''අද ගම්බද පළාත් වලදී පවා මට දනගන්න ලැබුනා විශේෂයෙන් මෙරට තරුණ කාන්තාව ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය ගැන විශේෂ සැලකිල්ලක් දක්වන බව. බොහෝ අවස්ථාවලදී ඔවුන් පිරිසිදු වතුර පානය කිරීම, ජලය උණු කර බීමට ගැනීම වැනි ඉතාමත් මූලික සෞඛ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳව පවා සිය දෙමාපියන්ට අවබෝධයක් නොමැති බව අපට හෙළිදරව් කළා. ඇතැම් අවස්ථාවලදී අපේ අමාත්‍යාංශය මගින් වැසිකිළි, ළිං ආවරණ ආදිය තනාදී පිරිසිදු කම පිළිබඳ අවබෝධයක් ඒ ගැමි කාන්තාවන් තුල ඇති කිරීමට කටයුතු කළා. ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය පිළිබඳ අවබෝධයක් තරුණියන්ට ලබාදීමෙන් ගම් මට්ටමින් සෑහෙක ඉටු කළ හැකි බව මම පිළිගන්නවා. බොහෝ අය කල්පනා කරන්නේ මුදල් වියදම් කරලා වෙදමින් බෙහෙත් ආදිය ලබා දීමෙන් පමණක් ලෙඩ රෝග දුරු කරගෙන සෞඛ්‍ය සම්පන්නව ඉන්න පුළුවන් කියලා. එහෙත් රෝග වලක්වන පණිවුඩය කාන්තාව මගින් ගම්බදට ගෙන යාමෙන් ගම් මට්ටමින් ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය තහවුරු කරන්න පුළුවනි. ගෙවත්තේ වැවෙන එළවළු, ගෙදර ඇති කාන දෙනෙකුගෙන් ලබා ගන්නා කිරි පාවිච්චි කරමින් තමන්ගේ දරුවන් සෞඛ්‍ය සම්පන්නව හද වඩා ගැනීමට පුළුවන්ය යන පණිවුඩය මම හිතන්නේ දන් ගැමි කාන්තාවන් වෙතට ලැබී තිබෙනවා. ගෙවත්තේම එළවළු යනාදිය වවා ගැනීමෙන් තම සැමියා ලබන ආදායමින් වෙළඳපොළට යන කොටස බොහෝ විට ඉතිරි කර ගන්න පුළුවන්. මේ අතින් ගෙදරදොර සෑකසුරුවම් කමද ඇති කර ගැනීමට ගැමි තරුණියන් ඉදිරිපත් වන බව සංතෝෂයෙන් කියන්නට පුළුවනි.''

## කටයුතු ව්‍යාප්තිය

''මීට පෙර කාන්තා කාර්යාංශය පිහිටුවා ඇත්තේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේයි. මේ අමාත්‍යාංශ දිස්ත්‍රික්ක මට්ටමේ වැඩ කරන නිලධාරීන් ග්‍රාමසේවක නිලධාරීන් සහ සහකාර දිසාපති ආදී කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව අපි වැඩ පිළිවෙල ඈත ගම්බද පෙදෙස් වලටත් ව්‍යාප්ත කරනවා. ලබන අවුරුද්දේදී සිට කාන්තා කාර්යංශයේ වැඩ කටයුතු විමධ්‍යගත කරන්න අපි අදහස් කරනවා. මේ කාර්යය ඉෂ්ඨ කරන්න දනටමත් භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලා තිබෙනවා. හැම දිස්ත්‍රික්කයකම දිසා කාර්යාලයක් පිහිටුවලා කාන්තා කාර්යාංශයට සම්බන්ධ නිලධාරියෙක් ඒ වාට පත් කළාම අපේ පණිවුඩය ගම් නියම්ගම් වලට ගෙන යාම පහසු අවනවා. දිස්ත්‍රික්කවල තරුණියන්ට එම ප්‍රදේශයේ තිබෙන කාර්යාල හා සම්බන්ධවී වැඩ කටයුතු කරන්නට එවිට පුළුවන් වෙනවා.

දුර බැහැර පළාත්වල ජීවත්වන තරුණියන් පිළිබඳ නොයෙකුත් ගැටළු අපේ නිලධාරි මහතන් විසින් අප වෙත ඉදිරිපත් කරනවා. ඒවාගේම දිසා මට්ටමින් සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු පාඨශාලා අ දිය පවත්වනකොට ඒ ඒ ආදල ප්‍රදේශවල කාන්තාවෝ ඔවුන්ගේ නොයෙකුත් ප්‍රශ්න ඒවායේදී ඉදිරිපත් කරනවා. ඒවාගේම කාන්තා කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා යටත් පිරිසයින් මාසකට වරක්වත් දිසා වැඩ කටයුතු කර ගෙන යන ආකාරය ගැන සොයා බලනවා.''

හුඟාක් අවස්ථාවල දී අපි නොයෙකුත් ස්ථානවල ක්‍රියාත්මක කර ඇති වාඩ පිළිවෙලවල් මගින් ඒ අවට අනිකුත් ගම්වල කාන්තාවන් ආදර්ශයක් ලබාගෙන සමහර වැඩ අපේ ආධාරය නැතිව ඒ අයම සල්ලි එකතු කර ගෙන නොයෙ ව්‍යාපෘති ආරම්භ කළ අවස්ථා තිබෙනවා. කාන්තා කාර්යාංශයෙන් ආරම්භ කරන නොයෙකුත් වැඩ කටයුතු වලට රජයෙන් වගේම පිටරටවල නොයෙකුත් ආයතනවලිනුත් මුදලින් ආධාර ලැබෙනවා. ඒ වගේම මම සැම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙන්ම ඉල්ලීමක් කරලා තිබෙනවා, ලබන අවුරුදේ විමධ්‍යගත අය වැයෙන් ආරම්භයේදීම අඩු ගණනේ රුපියල් ලක්ෂ එකහමාරක් වත් කාන්තා කටයුතු සඳහා වෙන් කරන්න කියලා. මන්ත්‍රීවරු විශාල ගණනක් දනටමත් ඒ විදිහට මට සහයෝගය දෙන බවට දන්වා තිබෙනවා.

## මැද පෙරදිගට යන වනිතාවන්

''මැද පෙරදිග යන තරුණ කාන්තාවන්ට ආරක්ෂාව සම්බන්ධයෙන් නොයෙකුත් කම්කටොළු වලට මුහුණ දෙන්න සිදුවෙන බව කවුරුත් දන්නා කාරණයක්. නොයෙකුත් කටයුතු ගැන දනටමත් විශේෂයෙන් කම්කරු අමාත්‍යාංශය වැනි අදාල අමාත්‍යාංශය සමග පැන නැගෙන ප්‍රශ්නවල ස්වරූපය අනුව කටයුතු කර තිබෙනවා.

මෙහිදී විශේෂයෙන් කිව යුතු වන්නේ මේ ගැටළු බොහොමයක් පැන නගින්නේ හරිහැටි අවබෝධයක් නොමැතිව තරුණ කාන්තාවන් යන්නත් වාලේ මැද පෙරදිග ගෘහ සේවිකාවන් වැනි තනතුරු ලබා ගෙන එහි යාමට ඉදිරිපත් වීමයි. මෙවැනි කාන්තාවන්ට පිට රට යාමට පෙර ඒ රටවලට ගොස් ජීවත්වන ආකාරය. නොයෙකුත් උපකරණ ක්‍රියාත්මක කරන ආකාරය ආදී කරුණු පිළිබඳ පුහුණුවක් ඔවුනට ලබා දෙනවා. මෙවැනි කාන්තාවන් ලබන වැටුප ඔවුන් මෙරටට පැමිණි පසු ඔවුනට ප්‍රයෝජනවත් වන ආකාරයෙන් යෙදවීමට හැකිවන අවස්ථා සැලසීමටත් මම බලාපොරොත්තු වෙනවා. බොහෝ අවස්ථාවලදී මෙවැනි කාන්තාවන් මෙරටට එවන මුදල් වෙනත් පවුලේ අය විසින් වියදම් කර නාස්ති කළ අවස්ථා අපට දැක ගන්නට ලැබෙනවා. බොහෝ අවස්ථාවල කොතරම් මුදල් ලබා ගෙන පැමිණියත් ප්‍රයෝජනවත් විදිහට ඒ මුදල් ආයෝජනය නොකරන නිසා ඔවුන්ගේ ජීවිත අඳුරට ගොදුරු වන අවස්ථා ගැන අපට දැක ගන්නට ලැබෙනවා. ඒ නිසා එවැනි කාන්තාවන්ටත් ඔවුන්ගේ පවුල් වලටත් සෙතක් සැලසෙන විදිහට ඒ මුදල් ආයෝජනය ගැන අවබෝධයක් ලබා දීමට වැඩ කටයුතු සැලැස්වීමටත් මම අදහස් කරනවා.''

## රැකියා කරන මවගේ ප්‍රශ්න

“මව සහ පියා දෙදෙනාම රැකියාවන් කරන අවස්ථාවල් ඔවුන් මුහුණ දෙන ගැටළු ගැන අපට අවබෝධයක් තියෙනවා. පිට රටවල නම් ඔවුන්ගේ දරුවා හද වඩා ගැනීමට නොයෙකුත් පහසුකම් යනාදිය සලසා තිබෙනවා. කිසියම් ආයතනයක් මගින් මෙවැනි වැඩ පිළිවෙලක් ආරම්භ කළොත් එයට උදව් දීමට අපට පුළුවනි.

මෙවැනි සඟරාවක් මගින් දිවයිනේ කාන්තාවන් වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට මට අවස්ථාවක් ලබා දීම ගැන මම සතුටු වෙනවා. අපේ රටෙහි සංස්කෘතික හා ආගමික පරිසරය කාන්තාව විෂයෙහි විධිමත් වැදගත් තැනක් ගන්නවා. ඈත අතීතයේ පටන්ම ශ්‍රී ලංකාවේ කාන්තාව තමන්ගේ ස්ත්‍රීත්වය පිළිබඳ චරියා ධර්ම ආරක්ෂා කරගත් කෙනෙක්. රටක් කොයි ආකාරයකින් දියුණු උනත් කාන්තාව කෙතරම් උසස් තානාන්තර වලට පත් වුවත්, මෙරට සංස්කෘතික රටාව තුල මුල් බැසගෙන ඇති කෘෂිකාර්මික කටයුතු වැනි දේවලට කාන්තාවන්ගේ විශේෂ සැලකිල්ල යොමු විය යුතු බව මගේ අදහසයි.



ස්වයං රැකියාවල නියැලෙන තරුණියන් දෙදෙනෙක්.

# සූර්ය බලයෙන් ධාන්‍ය සකසමු.

සූර්ය බලශක්තිය උපයෝගී කර ගෙන ක්‍රියාත්මක කෙරෙන සරල ධාන්‍ය බදින යන්ත්‍රයක් මිල අඩු අමු ද්‍රව්‍ය උපයෝගී කරගෙන නිර්මාණය කර ඇත. මෙය කෝපි රටකජු, කජු සහ වෙනත් ධාන්‍ය වර්ග බැද ගැනීම සඳහා භාවිතා කළ හැකිය.

බදින ද්‍රව්‍ය දැමීම සඳහා මි. මී. 150 ක උස, මි. මී. 145 ක විෂ්කම්භයකින් යුත් ටින් එකක් හෝ බැරලයක් ඇත. තුඩක් මත සවි කර ඇති බැවින් බැරලය භ්‍රමණය වේ. ඒ හේතුකොට ගෙන ද්‍රව්‍ය හොඳින් කවලම්වීමෙන් ඒකාකාරව බැද ගත හැකිය.

ටින්එකේ හෝ බැරලයේ සිලින්ඩරයේ කලු තීන්ත ආලේපකර ඇත. ඇලුමිනියම් ෂීට්වලින් නිම කළ වක්‍ර පරාවර්තකයක් (Curvedreflector) ටින් එක යටින් සවි කර ඇත.

ටින් එකේ කේන්ද්‍රයේ සිට පරාවර්තකයට ඇති දුර ප්‍රමාණය ටින් එකේ විෂ්කම්භය මෙන් දෙගුණයකට වැඩිවිය යුතුය. එහි පියන මත තව කිහිපයක් විද තිබීම නිසා තෙතමනය පිටවේ.

හොඳින් අව් රශ්මිය ඇති දිනකදී මෙම බදින යන්ත්‍රයෙන් පැයක හෝ දෙකක කාලයක් තුළ රටකජු ග්‍රෑම් 500 ක් පමණ බැද ගත හැකි බැව් මූලික පරීක්ෂණවලින් සෙනීගොස් ඇත.

මෙම උපකරණය වෙනුවෙන් රු. 180/- සිට 200/- දක්වාවූ මුදලක් වැයවනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙය නඩත්තු කිරීම අවශ්‍ය නැත. එමෙන්ම ඉන්ධන පිරිමසයි.

කෙසේ වෙතත්, මෙම බදින යන්ත්‍රය පාවිච්චි කළහැකි වනුයේ අනුපූරක යන්ත්‍රයක් වශයෙන් පමණී. මෙය අත්හද බැලීමේ මුල් යුගයේ පසුවන යන්ත්‍රයක් වන හෙයින්, දැනට භාවිත කළ හැක්කේ ඉතා හොඳින් හිරු රශ්මිය ඇති දිනයන්හි පමණී. එහෙයින් සෑමවිටම සාම්ප්‍රදායික බදින යන්ත්‍රයක්ද තබා ගැන්ම නුවණට හුරුවේ.